# විදාතා පුවත්

කාණ්ඩය - 01
කලාපය - 11

විද්‍යා හා තාක්ෂණ පුවත් සාර සංග්‍රහය

2006
නොවැම්බර්


# ජගත් විදු දින සැමරුමට විදාතා එක් වෙයි

2006 වසරේ නොවැම්බර් 10 වන දිනට යෙදී තිබුණු විද්‍යා දිනය වෙනුවෙන් විද්‍යා හා තාක්ෂණ ප්‍රදර්ශනයක් විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශයේ අනුග්‍රහයෙන්, ජාතික විද්‍යා පදනම සංවිධානයෙන් කොළඹ සිරිමාවෝ බණ්ඩාරනායක අනුස්මරණ ශාලාවේ දී දින 4ක් පුරා පවත්වනු ලැබී ය. 'ජාතික සංවර්ධනය සඳහා තාක්ෂණය' යන තේමාව යටතේ පැවැත්වූ මෙම ප්‍රදර්ශනයට විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රයට සම්බන්ධ විශාල ආයතන ප්‍රමාණයක වෙළඳ කුටි ඇතුළත් විය.

විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය විසින් පවත්වා ගෙන යනු ලැබූ විදාතා ප්‍රදර්ශන කුටිය මේ ප්‍රදර්ශනයේ සුවිශේෂී ස්ථානයක් ගනු ලැබී ය. දිවයින පුරා ම විසිරී ඇති විදාතා සම්පත් මධ්‍යස්ථානයන් ගෙන් තාක්ෂණය ලබා ගෙන ව්‍යවසායකයන් බවට පත් වූ ව්‍යවසායකයන් ගේ නිෂ්පාදන අලෙවි කිරීම හා ප්‍රදර්ශනය කිරීමේ පහසුකම සපයා දීම මේ විදාතා කුටිය මඟින් සිදු කරන ලදී.

දිවයිනේ නන් දෙසින් බිහි වූ ව්‍යවසායකයින් ඔවුන ගේ නිෂ්පාදන සමඟ මේ කුටියට සහභාගී වූ අතර, ඔවුන්ට එය නවතම අත්දැකීමක් විය.

මෙම විදාතා කුටියට සහභාගී වූ ව්‍යවසායකයන් හා ඔවුන් ගේ නිෂ්පාදනයන් පිළිබඳ විදාතා පුවත් තුළින් මෙසේ සටහන් කරන්නෙමු.



කුරුණෑගල විදාතා සම්පත් මධ්‍යස්ථානය මාර්ගයෙන් ආතර් සී ක්ලාක් ආයතනයේ ඇන්ටනා නිර්මාණය පිළිබඳ පුහුණු පාඨමාලාවට සහභාගී වී ලබා ගත් පුහුණුවෙන් පසු ධම්මිකා කුමාර මහතා විසින් ඇන්ටනා නමින් ඇන්ටනා නිෂ්පාදනයේ නියැලී සිටී. ඔහු ගේ ව්‍යාපාරය වෙසාක් ප්‍රමිතියෙන් යුතු ව පවත්වා ගැනීමට හැකි වූයේ ආතර් සී ක්ලාක් ආයතනයේ මඟ පෙන්වීම යටතේ බව ඔහු අපට පැවසී ය.





මැටි කර්මාන්තයේ යෙදී සිටින විජිතා රෝහිණී සෙනවිරත්න මැදවච්චිය විදාතා සම්පත් මධ්‍යස්ථානය සමඟ සම්බන්ධ වී ජාතික කාර්මික සංවර්ධන මණ්ඩලයේ සම්පත් දායකත්වය ලබා, විදුලි සකපෝරු භාවිත කර තම කර්මාන්තය දියුණු කර ගෙන සාර්ථක ව පවත්වා ගෙන යයි.

ජ. තිලකා..



1 පිටුවෙන්



මහරගම විද්‍යා සම්පත් මධ්‍යස්ථානය මගින්, කළමනාකරණය හා ගණකාධිකරණය පිළිබඳ දැනුම, වෙළඳපොළ දැනුම මෙන් ම සම්පත් ආයතනයින් ලබන යොමු වීම ආදී අනුග්‍රහයන් ලබමින් රෙදි පින්තාරු කර්මාන්තයට යොමු වී ඉරේෂා විජේසූරිය මහත්මිය තම ආදායම ඉහළ නංවා ගෙන ඇත.





මීරිගම විද්‍යා සම්පත් මධ්‍යස්ථානයෙන් වෙළඳපොළ කරා යොමු කිරීමෙන් හා නව ව්‍යාපාර සංවර්ධන අංශය කරා යොමු කිරීමෙන් ව්‍යවසායකත්වය හා කළමනාකරණ පුහුණුව ලබා සුදු පොල් තෙල් නිෂ්පාදනය කරනු ලබන සුසිල් රාජකරුණා මහතා ඉහළ ගුණාත්මක බවින් යුතු නිෂ්පාදන වෙළඳපොළට ඉදිරිපත් කරයි.







පොල් කටු ආශ්‍රිත විසිතුරු බඩු වෙළඳපොළට නිකුත් කරන එච්. ඒ. සී. කරුණාරත්න මහතා මීරිගම විද්‍යා සම්පත් මධ්‍යස්ථානය හරහා නව ව්‍යාපාර සංවර්ධන අංශය සහ කාර්මික සංවර්ධන මණ්ඩලය වෙත යොමු කිරීමෙන් අනතුරු ව ලැබූ ලී තාක්ෂණය ලබා ගෙන ඒ ආශ්‍රිත නිෂ්පාදනයන්ට ද යොමු වී ආදායමක් ලබයි.



සොරතා බූව නිෂ්පාදනය කරනු ලබන එස්. ඒ. විකුමසිංහ මහතා සාර්ථක ලෙස තම නිෂ්පාදන වෙළඳපොළට නිකුත් කරයි. විද්‍යා සම්පත් මධ්‍යස්ථානයේ පුහුණු වැඩසටහන්වලට සහභාගි වී ඔහු තාක්ෂණ දැනුම ලබා ගෙන ඇත.



උකුවෙල විද්‍යා සම්පත් මධ්‍යස්ථානයෙන් කිරි වී ඇඹි ජෑම්, චට්නි ආදී ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීමේ නියැලී සිටින්නේ ඉරේෂා වල්පොත්ත මහත්මියයි. ඇයට මෙම නිෂ්පාදන සඳහා විශේෂ ඇසුරුම් ද ලැබෙන බව විද්‍යා පුවත් වෙත පැවසී ය.



අවුරුදු තුනක් පමණ සිට මාතලේ විද්‍යා සම්පත් මධ්‍යස්ථානය හා සම්බන්ධව වී තාක්ෂණ ආධාර ලබා, බනිස් වර්ග නිෂ්පාදනය කරනු ලබන සී. එම්. ජේ. දිසානායක මහතා එමගින් හොඳ ආදායම් මාර්ගයක් සලසා ගෙන ඇත.






අධිකරණ ශ්‍රේෂ්ඨ උසාවි හා සාර්විත උසාව සඳහා පේටන්ට් බලපත්‍රය ලබා ගත් පී. එම්. ජයන්ත සිංහල අත්තනගල්ල විද්‍යා සම්පත් මධ්‍යස්ථානය මගින් උපදෙස් හා නිෂ්පාදන දියුණු කිරීම ලබා ගෙන ඇත.





ගැටන්වැල්ල විද්‍යා සම්පත් මධ්‍යස්ථානයෙන් විද්‍යා තාක්ෂණය ලබා ගනිමින් සාර්ථක ව නව නිෂ්පාදනයකට යොමු වී සිටින ඩබ්. පී. ශශිකලාවන් මහත්මිය ද අපට මුණ ගැසුණි. පතාස්, බෑග්, ඇඳ වර්ග විද්‍යාලය සහ බයිරිස්, රන පැදිලි නිෂ්පාදනය කරන ඇය මේ නිෂ්පාදනයන්ට සේවකයන් පස්දෙනෙක් ද සහභාගී වන බව ඇය පැවසුවා ය. මේ තාක්ෂණයෙන් විශිෂ්ට ව ස්වයං රැකියා ආරම්භ කිරීමට කැමති කාන්තාවන් සඳහා වැඩමුළු පැවැත්වීම ද ඇය විසින් සිදු කරයි. කෑගල්ල දිස්ත්‍රික්කයේ කාන්තා දින ප්‍රදර්ශනයේ දී ආහාර කුසලතාව පළමු ස්ථානය ද ඇය දිනා ගෙන ඇත.

# බලපිටිය විද්‍යා සම්පත් මධ්‍යස්ථානයේ ව්‍යවසායක වගතුග

## උම්බලකඩ නිෂ්පාදනයට යොමු වී



මධ්‍යස්ථානයේ නිලධාරියෙකු සමඟ තාක්ෂණය ලබා ගත් උම්බලකඩ නිෂ්පාදනයට යොමු වූ තැනැත්තිය.

විද්‍යා සම්පත් මධ්‍යස්ථානයෙන් තාක්ෂණික දැනුම ලබා ගෙන විසළන යන්ත්‍රය භාවිත කරමින් මහාපේලාවඩ පැලුගස් පළාතේ රසිකා දමයන්ති මහත්මිය උම්බලකඩ නිෂ්පාදනයට යොමු වී සිටී. ප්‍රදේශයේ බහුල ව පවතින මත්ස්‍ය සම්පත මේ නිෂ්පාදනය සඳහා යොදා ගන්නා බැවින් වැඩි ප්‍රතිලාභයක් ලැබීමේ හැකියාව ද වැඩි බව ඇයගේ අදහසයි. විසළීන යන්ත්‍රය භාවිත කරන බැවින් සාම්ප්‍රදායික උම්බලකඩ නිෂ්පාදන ක්‍රමවේදයට වඩා ඉතා පිරිසිදු ව හා සෞඛ්‍යමත්ව උසස් නිෂ්පාදනයක් තම වෙළඳපොළට ඉදිරිපත් කරන බව ද ඇයගේ අදහස විය. උම්බලකඩ නිෂ්පාදනය කාලය ද, වැය වන ශ්‍රමය ද අඩු බැවින් තම නිෂ්පාදනය වඩා වාසිදායී බව ඇය ගේ අදහස වී ඇත.

## කුරුඳු කර්මාන්තය සඳහා නව යන්ත්‍රෝපකරණ

කුරුඳු කර්මාන්තය සඳහා නව යන්ත්‍රෝපකරණ හඳුන්වා දීමේ වැඩසටහනක් පසුගිය දා බලපිටිය විද්‍යා සම්පත් මධ්‍යස්ථානයේ අනුග්‍රහයෙන් පවත්වන ලදී. පැලුගස් පළාත කුරුඳු ගම්මානයේ දී රුහුණු විශ්වවිද්‍යාලයේ සාමිකරණ පීඨයේ සම්පත් දායකත්වයෙන් නව වැඩමුළුව පැවැත්විණි. එහි දී කුරුඳු සීරීම, මැදීම, සහන් කිරීම යන කාර්යයන් සඳහා නිෂ්පාදනය කර ඇති නව උපකරණ හඳුන්වා දී එහි ක්‍රියාකාරිත්වය ද ඔවුන් සඳහා දීමක් සිදු කරන ලදී. කාර්මාන්ත කම්හලකින් වුව ද මේ සරල උපකරණ නිපදවා ගැනීමේ හැකියාව ඇති බව සම්පත් දායකයින් විසින් නව දැනුම් කුරුඳු නිෂ්පාදකයින් වෙත දන්වන ලදී.



කුරුඳු කර්මාන්තය සඳහා නව යන්ත්‍ර හඳුන්වා දීමේ වැඩසටහන. එහි දී කුරුඳු පොතු සීරීමට සහ මැදීමට ආදර්ශන ප්‍රදර්ශනයක් සමඟ රුහුණු විශ්වවිද්‍යාලයේ සම්පත් දායක ප්‍රවීණ සම්බන්ධ විය.

මේ උපකරණ භාවිතයෙන් දැනට පවතින සාම්ප්‍රදායික කුරුඳු කර්මාන්තයට නව ප්‍රබෝධයක් ලබා දීමට හැකි වන අතර, සාමාන්‍ය කර්මාන්ත කාලයකට වඩා වැඩි කාර්යක්ෂමතාවෙන් යුතු ව නව කිරීමේ දී ම කුරුඳු නිෂ්පාදනය සිදු කිරීමට හැකි වීම ද මෙහි ඇති වාසිදායක තත්ත්වයයි. වර්තමානයේ දී නව පරපුර කුරුඳු කර්මාන්තය හැර යාමේ ප්‍රවණතාවක් දක්නට ලැබෙන අතර, මේ නව උපකරණ නව පරපුරට ලබන ආයුරින් නිපදවා ඇති බැවින්, කුරුඳු කර්මාන්තයට නව ජවයක් ලබා ගත හැකි බව මේ වැඩමුළුවේ දී අනාවරණය විය. මේ ක්‍රමයන් භාවිත කර කුරුඳු කර්මාන්තයට යොමු වීමට දැනටමත් කණ්ඩායමක් සංවිධානය වී ඇති බව විද්‍යා සම්පත් මධ්‍යස්ථානය දැනුම් දී ඇත.

## විද්‍යා සම්පත් මධ්‍යස්ථානයෙන් යෝගට් නිෂ්පාදනයට



මධ්‍යස්ථානය මගින් පවත්වනු ලැබූ යෝගට් නිෂ්පාදන වැඩමුළුවකට සහභාගී වූ කාන්තාවන් ප්‍රායෝගික පුහුණුව ලබන අවස්ථාව...

බලපිටිය විද්‍යා සම්පත් මධ්‍යස්ථානයෙන් තාක්ෂණය ලබා ගත් පුනිලාගිනී හිදදකනු දැනට යෝගට් නිෂ්පාදනයට යොමු වී සිටී. ඇත් එක් නිෂ්පාදනයෙකු සමඟ නියැලුම් භාවිතය කරමින් ඇයි භාජනයන්හි අසුරන ලද යෝගට් වෙළඳපොළට නිකුත් කිරීමේ ආරම්භ බැලීම ද සිදු කරමින් සිටී. විද්‍යා සම්පත් මධ්‍යස්ථානය මගින් මේ සඳහා පසු විපරම් කිරීමේ යෙදී සිටින අතර, මහෙස්ට ම යෝගට් ඉන්ක්‍යුබේටර් නිපදවා ගැනීමේ උපදෙස් ද ලබා දෙමින් සිටින බව විද්‍යා සම්පත් මධ්‍යස්ථානය දන්වා ඇත.

**විද්‍යා පුවත් සංස්කාරක මණ්ඩලය**

අනුශාසනය හා අධීක්ෂණය
එස්. ජයසුන්දර මයා - ලේකම්
ඩී. ඒ. පී. අබේවර්ධන මිය - අතිරේක ලේකම් (සංවර්ධන)

සංස්කාරක
රුපා ප්‍රියාංගි රණනායක මිය
අතිරේක සහකාර ලේකම් (සංවර්ධන)

පුවත් සම්පාදනය හා ආයතන සම්බන්ධීකරණය
ප්‍රියංකා අබේකෝන් මෙනෙවිය
ප්‍රධාන කළමනාකරු විලයාට්

පරිගණක සැලසුම්
දී. ගොන්ට් මාස්ටර්

මුද්‍රණය
තරංජි ප්‍රින්ට්ස්, මහරගම

**විද්‍යා පුවත්**
විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය,
561/3, ඇල්විටිගල මාවත, කොළඹ 05.

## නව නිපැයුම්කරුවනට අත්වැල



මුදු ගාල්ල කරන සැහැලි ගසනා උපකරණය නිර්මාණය කළ නිපැයුම්කරු.

බලපිටිය ප්‍රදේශයේ සිටින නව නිපැයුම්කරුවන් විදාතා සම්පත් මධ්‍යස්ථානයට නිරන්තරයෙන් පැමිණෙන අතර, ඔවුන් ගේ නිෂ්පාදනයන් වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය මඟ පෙන්වීම විදාතා සම්පත් මධ්‍යස්ථානයෙන් බලාපොරොත්තු වන බව බලපිටිය විදාතා මධ්‍යස්ථානයේ විද්‍යා හා තාක්ෂණ නිලධාරිනිය විදාතා පුවත් වෙත දන්වා එවා ඇත. මෑදී ගාල්ල සැදීමේ දී සිටි ඔවිත්තවට උපකරණයක් නිෂ්පාදනය කරන ලද නව නිපැයුම්කරුවෙකු සම්පත් මධ්‍යස්ථානය මඟින් හඳුන්වා දීම සඳහා විදාතා පුවත් වෙත එවා ඇත. ඔහු වෙනත් බොහෝ නිපැයුම් ද සිදු කර ඇති අතර, වැඩි දියුණු කරන ලද සැහැල්ලියක් ද ඒ අතර වෙයි.

බලපිටිය ප්‍රදේශයේ පදිංචි එන්. ගුණදාස සිල්වා මහතා විසින් බිත්ති සැරසීම සඳහා ටයිල් ඛණ්ඩ නිපදවා ඇති බව විදාතා මධ්‍යස්ථානය අනාවරණය කරයි. ඒ සඳහා මැටි, සිමෙන්ති, ප්ලාස්ටික් අමුද්‍රව්‍ය ලෙස යොදා ගනිමින් මෙම ටයිල් නිපදවා ඇත. මෙම නිෂ්පාදනය තව දුරටත් වැඩි දියුණු කර දීම සඳහා විදාතා සම්පත් මධ්‍යස්ථානයේ අවධානය යොමු වී ඇති අතර ටයිල් සම්බන්ධ නාමික ආයතනයට යොමු කර ඇත. ඉතා අඩු වියදමින් විවිධ වර්ණවලින් ඔහු විසින් නිපදවා ඇති අතර, ඒ නිෂ්පාදන ඔහු ගේ නිවසේ භාවිතයට ගනී. මෙම නිෂ්පාදන වැඩි දියුණු කර ගැනීමට විදාතා සම්පත් මධ්‍යස්ථානය නිරන්තර සහාය ලබා දෙයි.

# විදාතා විදු දැක්ම කළුතර දී

ලෝක විද්‍යා දිනය නිමිත්තෙන් කළුතර දිස්ත්‍රික්කයේ විදාතා සම්පත් මධ්‍යස්ථාන එක් ව, විද්‍යා සංකල්පය හා විද්‍යා සහ තාක්ෂණ දැනුම ග්‍රාමීය ප්‍රජාව හා පාසල් සිසුන් අතර ප්‍රචලිත කිරීම සඳහා වැඩසටහන් මාලාවක් ක්‍රියාත්මක කරන ලදී. මෙහි පළමු අදියර වශයෙන් පාසල් අතර විද්‍යා දැනුම මිනුම් කරන, විද්‍යා ප්‍රබන්ධ නිර්මාණ, කථික තරග, චිත්‍ර තරග ආදී ක්‍රියාකාරකම්වලින් දිස්ත්‍රික් මට්ටමේ තරග පැවැත්වීම සිදු කරන ලදී. දෙවන අදියර වශයෙන් හොරණ ශ්‍රීපාලි මහා විද්‍යාලයේ දී දින තුනක් පුරාවිද්‍යා හා තාක්ෂණ ප්‍රදර්ශනයක් උත්කර්ෂවත් ලෙස පවත්වන ලදී.



විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශයට අයත් ආයතන හා පෞද්ගලික ආයතනවල තාක්ෂණික දැනුම හා මෙවලම් ඇතුළත් ප්‍රදර්ශන කුටි 40ක් පමණ මෙම ප්‍රදර්ශනයට ඇතුළත් වී තිබිණි. විදාතා සම්පත් මධ්‍යස්ථානයන් හරහා බිහි වූ ව්‍යවසායකයන් ඔවුන්ගේ නිෂ්පාදනයන් ප්‍රදර්ශනය කිරීම ද මෙම ප්‍රදර්ශනයේ දී සිදු විය. කළුතර දිස්ත්‍රික්කයේ පාසල්, විවිධ සංස්කෘතික අංග ඉදිරිපත් කරමින් ප්‍රදර්ශනය ආලෝකවත් කිරීම විශේෂත්වයක් විය. දිස්ත්‍රික් මට්ටමින් පවත්වන ලද පාසල් තරඟයන්හි ජයග්‍රාහකයන්ට ත්‍යාග පිරිනැමීම ද මෙම ප්‍රදර්ශනයේ දී සිදු විය. කළුතර දිස්ත්‍රික්කයේ විදාතා සම්පත් මධ්‍යස්ථානයන්හි සිටින විද්‍යා හා තාක්ෂණ නිලධාරීන් ගේ සහයෝගිතාවයෙන් හා කළුතර දිස්ත්‍රික් ලේකම්, ප්‍රාදේශීය ලේකම්වරුන් ගේ ප්‍රධානත්වයෙන් යුතු ව මෙම වැඩසටහන සාර්ථක ලෙස පැවැත්වූ බව විදාතා පුවත් වෙත දන්වා තිබිණි.

# ව්‍යවසායකත්ව පුහුණු වැඩමුළුවක් කොළඹට



කොළඹ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පදිංචි සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් 35 දෙනෙකු සඳහා පසුගිය දා ව්‍යවසායකත්ව පුහුණු වැඩසටහනක් කොළඹ ප්‍රාදේශීය ලේකම් කාර්යාල ශ්‍රවණාගාරයේ දී පවත්වන ලදී. ප්‍රායෝගික ක්‍රියාකාරකම්වලින් ද සමන්විත වූ මෙම වැඩසටහනට අනුග්‍රාහකත්වය ශ්‍රී ලංකා රතු කුරුස සංගමයෙන් ලබා දී තිබූ අතර, සම්පත් දායකත්වය ලබා දෙමින් මෙම වැඩමුළුව සංවිධානය කරන ලද්දේ කොළඹ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ විද්‍යා හා තාක්ෂණ නිලධාරී වසන්ත ගුණසිංහ මහතා සහ මහර විදාතා සම්පත් මධ්‍යස්ථානයේ විද්‍යා හා තාක්ෂණ නිලධාරිනී දර්ශිකා මෙණෙවිය විසිනි.



**විදාතා පුවත්**
විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය,
561/3,
ඇල්විටිගල මාවත,
කොළඹ 05.